# පොකුණුවිට, කිත්සිරිමෙවන් රජමහා විහාරයේ සිතුවම් හා ප්‍රතිමා පිළිබඳ කලාත්මක අධ්‍යයනයක්

ආර්.ඒ.ඩී.එන්. චන්ද්‍රකුමාරි

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
nadeesharanasinghe94@gmail.com

ප්‍රමුඛ පදඃ සිතුවම්,ප්‍රතිමා,විහාරය

## හැඳින්වීම

පිහිටීම වශයෙන් ගත්කල බස්නාහිර පළාතට අයත් කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයට අයත් හොරණ පොකුණුවිට නම් ග්‍රාමයෙහි පිහිටි ඓතිහාසික වැදගත්කමක් ඇති විහාරස්ථානයක් ලෙස පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරය දැක්විය හැකිය. පුරාණ මහා විහාරය, ශෛලමය විහාරය, ජේතවන විහාරය නමින් විහාර මන්දිර කිහිපයක් මෙහි ඇත.පැරණි මහා විහාරය මහනුවර යුගයේ ගෘහ නිර්මාණ සම්ප්‍රදාය අනුව තනා තිබේ.පැරණි විහාර මන්දිරයේ ඇති ප්‍රතිමා මහනුවර යුගයේ මූර්ති ශිල්පයටත් සිතුවම් මහනුවර යුගයේ සිතුවම් කලාවටත් නෑකම් කියයි.දක්ෂ කලාකරුවන්ගෙන් සපිරි ඓතිහාසික බවින් යුතු කලා පුරවරයක් බඳු වූ ප්‍රදේශයක පිහිටි පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරය බස්නාහිර පළාතේ පැරණිතම විහාරස්ථානය වශයෙන් ද සැලකිය හැකිය. එහි පැරණි විහාරයේ දක්නට ඇති මහනුවර යුගයේ අගභාගයට අයත් සිතුවම් හා ප්‍රතිමා පිළිබඳ කලාත්මක අධ්‍යයනයක් සිදු කිරීම මෙම පර්යේෂණය තුළින් බලාපොරොත්තු වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනය සිදු කිරීමේදී ක්‍රමවේද ලෙස ක්ෂේත්‍ර නොවන ගවේෂණය හා ක්ෂේත්‍රගවේෂණය භාවිත කරන ලදි.

ක්ෂේත්‍ර නොවන ගවේෂණයේ දී විහාරස්ථානයේ තොරතුරු හා සිතුවම් හා ප්‍රතිමා පිළිබඳ පොත් පත් පරිශීලනය කරන ලදි. ක්ෂේත්‍ර ගවේෂණයේ දී අදාළක්ෂේත්‍රයට ගොස් ප්‍රායෝගික ව අධ්‍යනය කර ඡායාරූප ලබා ගෙන සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස් කර තොරතුරු සකසා ගැනීමයි.ඒ අනුව මෙම පර්යේෂණය පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරයේ පැරණි විහාර මන්දිරයේ ඉපැරණි සිතුවම් හා ප්‍රතිමා පිළිබඳ කලාත්මක අධ්‍යනයකට සීමා වූ අතර ඉහත ක්‍රමවේද අනුව තොරතුරු රැස් කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡා

කළුතර දිස්ත්‍රික්කයේ හොරණ පොකුණුවිට නම් ග්‍රාමයෙහි පිහිටි ඓතිහාසික වැදගත්කමක් ඇති විහාරස්ථානයක් ලෙස පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරය දැක්විය හැකිය. මෙම විහාරස්ථානයට පිවිසෙන භූමියේ තැනිතලා බවක් දක්නට ලැබුණ ද විහාර මන්දිර, ස්ථූපය හා බෝමලුව ආදී විහාරාංග පිහිටා ඇත්තේ අඩි 50 ක් තරම්

උස් වූ ගල්තලාවක් මත ය. මෙහි සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කර හතක් පමණ වේ.

ඓතිහාසික මෙන්ම කලා පුරවරයක් බඳු වූ ප්‍රදේශයක පිහිටියා වූ මෙම පුරාණ විහාරය විවිධ රාජ්‍ය යුගයන්ට නෑකම් කියන යම් ඓතිහාසික කාරණා සහ පුරාවිද්‍යාත්මක නටබුන්වලින් සමන්විතය. එනම්

- ශිලා ලේඛනය
- ඉපැරණි විහාර මන්දිරය
- බෝ මළුව
- ස්තූපය
- පොහොය සීමා මන්දිරය
- ආවාස ගෘහය ආදියයි.

මෙම විහාරස්ථානයේ ආරම්භය නිශ්චිත වශයෙන් සඳහන් කළ නොහැකි වුවද ක්‍රි.ව. 4 වැනි ශතවර්ශය හා සම්බන්ධ බ්‍රාහ්මීය අක්ෂරයෙන් ලියවුණු මෙහි ඇති ශිලා ලේඛනය මගින් යම් කිසි කාල නිර්ණයක් සිදු කළ හැකිය. අනුරාධපුරයේ රජකළ (ක්‍රි.ව 301) කීර්ති ශ්‍රී මේඝවර්ණ රාජ සමයෙහි "දේව" නම් අමාත්‍යවරයෙකු මේ විහාරස්ථානයට කළ පූජාවක් පිළිබඳව එම ශිලා ලේඛනයෙහි සඳහන් වන බව පරණවිතානගේ මතයයි.

විහාර මන්දිර කිහිපයකින් සමන්විත වුවද මෙහි ඇති පැරණි විහාර මන්දිරයේ සිතුවම් හා ප්‍රතිමාවල ඇති කලාත්මක අගය පිළිබඳව මෙහිදී වැඩි අවධානය යොමු කෙරේ.මෙමපැරණි විහාර මන්දිරය ගොඩනංවා ඇත්තේ අඩි 50 ක් තරම් උස් වූ ගල්තලාවක් මතය.කෙටි බිත්ති මත ඉහළට නැංවුනු කුළුණු 16කට හා මැද පිළිමගෙයට සම්බන්ධ වන ලෙස මෙම පඨිමාඝරයෙහි වහළය ඉදිකර ඇත. මෙම විහාරගෙයි ගෘහ නිර්මාණ ශිල්පය,සිතුවම් හා ප්‍රතිමා පරික්ෂා කිරිමේදී නුවර යුගයේ අග භාගයට අයත් ලක්ෂණ දැකගත හැකිය.

පිළිමගෙයට ඇතුළුවන දොරටුවට ඉහළින් හා දෙපසින් ඇති බිත්තියේ කලාත්මක අගයෙන් අනූන වූ මකර තොරණකි.මෙම මකර තොරණෙහි විවිධ මූර්ති අඹා ඇති අතර අවකාශය පූර්ණය කරනු වස් කලාත්මක චිත්‍ර රටා රැසක් ඇඳ තිබේ. මෙම චිත්‍ර හා මූර්ති මහනුවර යුගයේ ලක්ෂණ පෙන්වන අතර පහතරට හා හින්දු ආභාසයත් යම් තරමින් ලැබී ඇති බව පෙනේ.

මකර තොරණට ඉහළින් දේව ප්‍රතිමා රැසක්ද දොරටුවට දෙපසින් දේව ප්‍රතිමා හා සත්ව රූපද අඹා ඇත. මහනුවර යුගයට අයත් කන්ද උඩරට සිතුවම්වල වැඩි වශයෙන් දක්නට නොලැබෙන නිල් වර්ණය මෙම විහාරස්ථානයේ සිතුවම් තුළින් දැකගත හැකි වේ.මකර තොරණෙහි මකරුන් වර්ණ ගැන්වීමටද නිල් වර්ණය යොදාගෙන ඇත. පසුබිම රතු වර්ණයෙන් යුක්ත වේ.

පඨිමාඝරයේ පිටත බිත්ති තීරුවලට බෙදා එහි ඉහළින් විහාරය වටා සූවිසි විවරණය සිතුවම් කර ඇත. එහි බුදු රුව ඇඳ ඇත්තේ අන් මානව හා දේව රූපවලට වඩා විශාල අයුරිනි.සිරස් පත,ශරීරය වටා රශ්මි මාලාව,සිවුරේ රැලිවල පිහිටීම දියරැලි සේ වීම සහ මහනුවර යුගයේ බුදු පිළිමවල ලක්ෂණ මෙම සිතුවම් තුළද එලෙසින්ම ඇත.අච්චුවකින් ඇඳ ඇති සේ බුද්ධ රූප එකම ආකාරයෙන් දිස්වීම මෙහි විශේෂත්වයකි.

සූවිසි විවරණයට යටින් සිතුවම් කර ඇත්තේ තේලපත්ත ජාතක කතා වස්තුවයි. තේලපත්ත ජාතකය දැකිය හැක්කේ මුල්කිරිගල හා පොකුණුවිට යන විහාරස්ථානවල පමණි.මූලික වශයෙන් නිල්,රතු,කලු සහ කහ යන වර්ණ යොදාගෙන ඇත. ගස් හා මානව රූප බහුල අතර සිද්ධියක් තවත් සිද්ධියකින් වෙන් කර ඇත්තේ ගසක් උපයෝගී කර ගනිමිනි. ප්‍රවේශ දොරටුවේ පියන්

දෙකෙහි කලාත්මක ලෙස නාරිලතා පුෂ්පය සිත්තම් කර ඇත.

දොරටුවෙන් ඇතුළුවත්ම දකුණු පස බිත්තියේ දොරටුවේ උසට සරිලන උසකින් යුතු දේව රූපයකි.එය ගම්භාර දෙවියන්ගේ බව පවසයි. දේව රූපය උස් හිස් පළඳනා සහිත අලංකාර වස්ත්‍රාභරණයෙන් යුතුව කලාත්මක ලෙස සිතුවම් කර ඇත. කහ,රතු,කොළ, සුදු වර්ණ දේව රූපයට යොදාගෙන ඇති අතර පසුබිම කලු පැහැයෙන් යුක්ත වේ.

ඇතුළුවන දොරටුවේ වම් පස බිත්තියේ එවැනිම දේව රූපයක් ඇත. ඒ කතරගම දෙවියන්ගේ බව පැවසෙයි. දකුණු පස දේව රූපයට ඉහළින් මහනුවර යුගයේ සිතුවම්වල ලක්ෂණ පෙන්වන එක් පසකට හැරී වැඳගෙන සිටින කුඩා මිනිස් රූප පෙළකි.ඇතුළත බිත්තිවල සිතුවම් හා ප්‍රතිමාවලට අමතරව ඇති හිස් බව දුරලීමට අලංකාර මල් මෝස්තර ඇඳ තිබේ.

පිළිමගෙය ඇතුළට පිවිසෙන විට දක්නට ලැබෙන්නේ සමාධි සුවයෙන් වැඩ සිටින බුද්ධ ප්‍රතිමා වහන්සේ නමකි.මෑත කාලීනප්‍රතිසංස්කරණවලට ලක්ව ඇති මෙම ප්‍රතිමා වහන්සේ මහනුවර යුගයේ මූර්ති සම්ප්‍රදාය පිළිඹිබු කරයි. මෙම බුදු පිළිමය කේන්ද්‍රීය පිළිමය වශයෙන් වන අතර ඊට අමතර ව තවත් හිටි ඉරියව්වෙන් යුත් බුදු පිළිම දෙකක් හා ඊට එපිටින් හිටි ඉරියව්වෙන් යුත් විෂ්ණු හා සමන් දේව ප්‍රතිමා දෙකක් ද නෙලා ඇත.

හිටි පිළිම වහන්සේ දෙනම අභය මුද්‍රාව නිරූපණය කරයි.මහනුවර යුගයේ ප්‍රතිමාවල ලක්ෂණ වන චීවරය දියරැලි ස්වරූපයක් ගැනීම දක්නට ලැබේ.දෙපා සිට සිරස දක්වාම ෂඩ් වර්ණ රශ්මි මාලාවක් විහිදේ.හිටි පිළිමය හා සමාන්තරව බිත්තියේ නිල් පැහැ පසුබිමකි.ඊට අමතරව වැදගත් වන්නේ මෙහි ඇති විෂ්ණු හා සමන් දේව ප්‍රතිමා දෙකයි.ඒවාද හිටි ඉරියව්වෙන් යුක්තය.මෙම දේව ප්‍රතිමාව වටා රාමුවක් ඇති අතර දෙපසින් කුඩා මානව ප්‍රතිමා දෙකක් ඔසවා ගත් කුළුණු දෙකකි. ඊට ඉහළින් මකර ගිනිදැල් විහිදෙන තොරණක් ලෙසට සකසා ඇත. මෙම ප්‍රතිමා උස් හිස්පළඳනා සහිතව අලංකාර වස්ත්‍රාභරණයෙන් සරසා ඇත. නිල්, රතු, කහ, සුදු, කලු යන වර්ණ භාවිත කර තිබේ. මෙම ප්‍රතිමාවලින් පරිබාහිර අවකාශය පූර්ණය කරනු පිණිස විවිධ සිතුවම් ඇඳ ඇති බව පෙනේ. එම සිතුවම් විහාර මන්දිරය ඇතුළත කලාත්මක අගය වැඩි කර ඇත.

සමස්තයක් ලෙස ගෙන බලන කළ කිත්සිරිමෙවන් රජමහා විහාරයේ පැරණි විහාර මන්දිරයේ ප්‍රමුඛත්වය දී ඇත්තේ ප්‍රතිමා නිර්මාණය සඳහාය.සිතුවම් හරහා හිස් අවකාශය පූර්ණය කිරීම සිදුකර ඇත.එසේ වුවද මෙහි ඇති සිතුවම් කලාත්මක අගයෙන් අනූන සිතුවම් වන අතර වර්තමානයේ සිතුවම් රැසක් ඛේදනීය ලෙස විනාශ මුඛයට පැමිණ ඇති බව පෙනේ.කලාත්මක වටිනාකමින් යුතු මෙම විහාරස්ථානයේ සිතුවම් හා ප්‍රතිමා සංරක්ෂණය පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් කොට සැලකිය යුතු බව මින් පැහැදිළි වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අරියවංශ හිමි, රැටියල. (2011)*ඓතිහාසික පොකුණුවිට කිත්සිරිමෙවන් රජමහා විහාරය*. කර්තෘ ප්‍රකාශන.

ගමගේ, ජේ. නිමල්. (1996)*හෙළ කලා උරුව*.වැලිගමඃ සත්මිණ මුද්‍රණාලය.


**සම්මුඛ සාකච්ඡා**


ඉන්ද්‍රකුමාර, සමන්. (2018) පොකුණුවිටදී සිදු කරන ලද සම්මුඛ සාකච්ඡාව.